කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 48

මගේ අංකය : DMS/Circular/2012
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2012.12.10

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>2013 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල දීමනා සංශෝධනය කිරීම</u>**

01. 2013 අයවැය යෝජනා මඟින් ප්‍රකාශිත දීමනා ගෙවීම පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

02. ඒ අනුව, පහත සඳහන් (i, ii හා iii) කාණ්ඩයන්ට ඇතුළත් <u>නොවන</u>, සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මඟින් ආවරණය වන ව්‍යාපෘති කාර්ය මණ්ඩල මෙම ගෙවීම් සඳහා හිමිකම් ලබයි.

   i. සාමූහික ගිවිසුම් මගින් හෝ ඒ ආකාරයේ අවබෝධයකින් වැටුප් තීරණය කරනු ලබන ආයතන
   ii. පාරිභෝගික මිල දර්ශකය පදනම් කොට ගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් මාසිකව ගෙවනු ලබන ආයතන
   iii. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලැබූ ආයතන

03.**<u>ජීවන වියදම් දීමනාව</u>**

2011.01.10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 43 හා 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 අනුව ඉහත අංක 02හි සුදුසුකම් ලබන කාර්ය මණ්ඩල සඳහා දැනට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව 2013.01.01 දින සිට රු.6,600/- ක් විය යුතුය.

04. <u>විශේෂ දීමනාව</u>

අවමය රු.750/- ක් සහ උපරිමය රු.2,500/- කට යටත්ව දීමනා රහිත මූලික මාසික වැටුපෙන් 5% ක් වන සේ ගණනය කර 2011.12.12 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 46 හි අංක 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාර ගෙවනු ලබන විශේෂ දීමනාවට එකතු කර පහත සඳහන් පරිදි ගෙවිය යුතුය.

| වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (මාසික) | ක්‍රියාත්මක වන දිනය | වැඩිවන මුදලින් ගෙවිය යුතු ප්‍රතිශතය |
|---|---|---|
| රු. 24725/- ට අඩු | 2013.05.01 | 50% |
| | 2013.09.01 | ඉතිරි 50% |
| රු. 24725/- හා ඊට වැඩි | 2013.07.01 | 50% |
| | 2013.10.01 | ඉතිරි 50% |

05. <u>දෛනික වේතන මත සේවය කරන සේවකයින්ට දීමනා</u>

5.1 අනියම්/දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට 2011.01.10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 43 හි 4.2 ඡේදය යටතේ වන දෛනික ජීවන වියදම් දීමනාව 2013.01.01 දින සිට රු.220/- ක් වන සේ ගෙවිය යුතුය.

5.2 මෙම සේවකයින්ට ඉහත අංක 04 ඡේදයෙහි සඳහන් පරිදි විශේෂ දීමනාවද එක් එක් මාසයේ සේවය කර ඇති එක් දිනකට 1/30 පදනම මත එහි සඳහන් විධිවිධානයන්ට යටත්ව ගෙවිය යුතුය.

06. <u>සාවද්‍ය ගණනය කිරීම්</u>

මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳ අදාල ආයතනයේ මූල්‍ය කළමනාකරු/ ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් හෝ ගෙවීම් සිදු කරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාල බලධාරීන් ක්‍රියා කළ යුතු වේ.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව